# භික්ෂු ජීවිතයේ ඇති ආස්වාදය කුමක් ද?

ත්‍රිපිටකවේදී මකුලෑවේ විමල ස්ථවිරයන් වහන්සේ
විසිනි.

**භාග්‍යවත්** බුදුරජාණන් වහන්සේ ස්වකීය ශාස්තෘවරයා වශයෙන් පිළිගෙන වසන පිරිස ගිහි-පැවිදි යනුවෙන් දෙ කොටසෙකින් යුක්ත ය. එයින් පැවිදි පිරිස ප්‍රධාන වේ. බුදුසසුන රැකගැනීමේ ප්‍රධාන වගකීම පැවරී ඇත්තේ ද පැවිදිපිරිසටය. පැවිදිපිරිස නැතිවූ විට බුදුසසුනෙක් ද නැත.

පැවිද්ද බාහිර යැ ශාසනිකයැයි දෙවැදෑරුම් වේ. ඉන් බාහිරපැවිද්ද කර්මවාදී ක්‍රියාවාදී තවුසන්ගෙන් ලැබෙන්නෙකි. අබුද්ධොත්පාද කාලයෙහි ද ඒ බාහිර ප්‍රව්‍රජ්‍යාව ලැබූ පැවිද්දෝ සිටියහ. ඔවුහු ද ගිහිසැපයෙහි කළකිරී පැවිදිවූවෝ වෙති. එහෙත්, බුදුසසුනෙන් බැහැර වූ අන්‍ය-ශාසනයන්හි සෝතාපන්න, සකෘදගාමී, අනාගාමී, අර්හත් යන ආර්‍ය්‍ය උතුමෝ නැත. බාහිරශාසනයන්හි අනිත්‍යාදි ත්‍රිලක්ෂණය මෙනෙහි කිරීමක් නොමැති හෙයිනි. බුදුරජාණන්වහන්සේගේ (පිරිනිවන්පෑමට ආසන්න මොහොතේ දී පැමිණ රහත් වූ) අන්තිම සම්මුඛශ්‍රාවකයා වූ සුභද්‍රයන්හට වදළ:-

සුභද්‍ර! යම් ධර්මවිනයෙක්හි අරිඅටඟි මග නො ලැබේ නම් එහි ප්‍රථම ශ්‍රමණයෙක් ද දෙවෙනි ශ්‍රමණයෙක් ද තෙවෙනි ශ්‍රමණයෙක් ද සතරවන ශ්‍රමණයෙක් ද නැත. සුභද්‍ර! යම් ධර්මවිනයෙක්හි අරිඅටඟිමග ලැබේ නම් ප්‍රථම ශ්‍රමණයා ලැබෙන්නේත් එහි ම ය. දෙවැනි තෙවැනි සතරවැනි ශ්‍රමණයන් ලැබෙන්නේත් එහි ම ය. සුභද්‍ර! මාගේ ධර්මවිනයෙහි (සසුනෙහි) අරිඅටඟිමග ලැබෙන්නේ ය. එහෙයින් ප්‍රථම-ද්විතීය-තෘතීය- චතුර්ථ ශ්‍රමණයෝ මෙහි ම ඇත. අන්‍ය ශාසනයෝ ශ්‍රමණයන්ගෙන් හිස් වූවෝ වෙති.[1]

යන මේ දේශනාවෙන් ඉතා හොඳින් පැහැදිලි වන කරුණෙක් නම් ''ශ්‍රමණ'' යන වචනය පවා අරි අටඟිමඟ නො යෙදෙන සසුනෙක නො ලැබෙනබව යි. මෙහි සඳහන් ප්‍රථම, ද්විතීය, තෘතීය, චතුර්ථ ශ්‍රමණයෝ නම් සෝතාපන්න සකෘද ගාමී, අනාගාමී, අර්හත් යන සතරමග-සතරඵලවලට පැමිණි ආර්‍ය්‍යයෝ යි. එහෙයින් ස්වකීය උපභෝග - පරිභෝග සියලු වස්තූන් අත්හැර බුදුසසුනෙන් පැවිදි වන කුලපුත්‍රයා ම ''ශ්‍රමණ'' නාමයෙන් සැලකීම මෙහි දී යෝග්‍ය වේ.

භික්ඛු ශබ්දය පිළිබඳ අර්ථවිවරණය ද මෙහි දී මඳක් විමසා බැලීම සුදුසු ය.

**ඡින්නභින්නපටධරොති භික්ඛු:-**

'වටිනාකමින් ද පැහැයෙන් ද අඩු සුව පහසු නැති සුන්බුන් පිළිදරන්නා යන අර්ථයෙන් ''භික්ඛු'' නම් වේ. කොපමණ වටිනා වස්ත්‍රයක් වුවත් සැතෙකින් සිඳ දැමූ විට එය පළමු අගයෙන් අඩක්වත් නො වටිනා බවට යේ. නූල්වලින් ගෙත්තම් කරනවිට රළුපහස් ඇතිබවට පැමිණේ. මැසීමේ දී හිඳිමලින් ද ඩහදියමලින් ද පඬු පෙවීමෙන් ද එහි පියවි පැහැය නැති වී යයි. එවැනි වස්ත්‍රය දුර්වර්ණ ඇතියෙකි. මෙපරිදි ගිහියන්ගේ ඇඳුම්වලට වෙනස් වූ කසට රැඳූ සිවුරු දරන්නා ''භික්ඛු'' නමින් හැඳින් වේ.

භික්ඛතීති භික්ඛු:-

දුගී-මගී යාචකාදීන් මෙන් දෙන්න, දෙන්නැ'යි හමුවන හමුවන අයගෙන් නො ඉල්ලා ලැබුණත් නො ලැබුණත් ගෙයක් පාසා ගොස් උදෙසා සිටීම නම් වූ ආර්‍ය්‍ය යාච්ඤාවෙන් යදී නුයි භික්ඛු නම් වේ.

භික්ඛාචරියං අජ්ඣුපගතෝති භික්ඛු:-

මඳ වූ හෝ බොහෝ වූ හෝ ධන ධාන්‍යාදි සම්පත් අත් හැර ගිහිගෙන් නික්ම සසුනෙහි පැවිදි ව ගිහියන් කරන ගොවිතැන් වෙළෙඳම් ආදියෙන් වෙන් ව අනුන් විසින් දෙන ලද භික්ෂාවෙන් යැපේ නුයි භික්ඛු නම් වේ.

සමග්ගෙන සඞ්ඝෙන ඤත්තිචතුත්ථෙන කම්මෙන අකුප්පෙන ඨානාරහෙන උප සම්පන්නොති භික්ඛු:-

සමග සඞ්ඝයා විසින් අකොප්‍ය වූ ශාස්තෘශාසනයට සුදුසු ඤත්ති චතුර්ථ කර්මයෙන් උපසපන් කරනලද බැවින් ද භික්ඛු නම් වේ.

භද්‍රො භික්ඛු:- සීලාදියෙන් යහපත්වූයේ භික්ඛු නමි.

සාරො භික්ඛු ශීලාදියෙන් සාර වූයේ භික්ඛු නමි.

අග්ගො භික්ඛු:- සීල - සමාධි - ප්‍රඥා විමුක්තියෙන් අග්‍රභාවයට පැමිණියේ භික්ඛු නමි.

මෙසේ බුදුසසුනේ පැවිදිවන කුල පුත්‍රයාට නොයෙක් අරුතෙන් භික්ඛු යනු භාවිත කරනු ලැබේ.

පැවිද්දේ අගය:-

බුදුදහම අනුව බලනවිට භික්ෂු ජීවිතය ලොකයේ දක්නට ලැබෙන උසස් ජීවිතයයි. බුද්ධශාසනයේ ලැබෙන භික්ෂුජීවිතය ලෝකයේ පවත්නා දුලබ දෑ අතුරෙන් ද ඉතාම දුලබ වූවෙකි. මක්නිසාද? බුදුසසුනේ පැවිද්ද ලැබීමේ දී දුර්ලභ කරුණු රාශියක්ම සම්පූර්ණවියයුතු හෙයිනි. මිනිසත් බව ලැබීම, බුද්ධොත්පාදකාලයක් ලැබීම, ක්ෂණසම්පත්තිය ලැබීම, සද්ධර්මශ්‍රවණයක් ලැබීම, යන කරුණු භික්ෂුත්වය ලැබීමට පෙර සම්පූර්ණවියයුතු අතිශය දුර්ලභකාරණයෝ වෙති. ඒ බව බුදුරජාණන් වහන්සේ විසින් නිතරම භික්ෂූන් අමතා වදරන ලද

"අප්පමාදෙන භික්ඛවෙ සම්පාදෙථ, දුල්ලභො බුද්ධුප්පාදො ලොකස්මිං දුල්ලභෝ මනුස්සත්ත පටිලාභො දුල්ලභා ඛණසම්පත්ති, දුල්ලභා පබ්බජ්ජා දුල්ලභං සද්ධම්මසවණං" යන අවවාද පාඨයෙන් ද මනාව පැහැදිලි වේ. අද අබෞද්ධයන් පමණක් නොව අපේ බෞද්ධයන් පවා ඉතා උසස් ලෙස සලකන පඤ්චාභිඥ අෂ්ට සමාපත්ති පවා එතරම් දුර්ලභ දේ ලෙස බුදුසමයේ නුගන්වයි. ඒවායින් කවරකුටවත් කවරදවත් නිවන නො ලැබෙන හෙයිනි. ඒ නිසා ම ය. ලෝකයේ දුලබ දෑ විසින් බුද්ධ, ධම්ම, සඞ්ඝ යන තෙරුවන පෙන්වූයේ මිනිසත්බව හා බුදුසසුන ලැබූ පමණකිනුත් මේ භික්ෂුජීවිතය ලබාගැනීම පහසු නො වේ. පැවිද්ද ලබන්නා බුදුරජාණන් වහන්සේ විසින් පැවිදි නො කළ යුතු පුද්ගලයන් වශයෙන් විනයේදී ප්‍රතික්ෂිප්ත ජාතිඅන්ධ, ජාතිබධිර පණ්ඩක, නපුංසක ආදි අභව්‍ය පුද්ගල සංඛ්‍යාවට අයත් නො වූ භව්‍ය පුද්ගලයකුද වියයුතුය. මේ ආදි කරුණුරාශියකින් සම්පූර්ණවූ ම පුද්ගලයකු විසින් ලැබිය යුතු බැවින් පැවිද්ද ඉතා දුලබ බව දෙසුසේක.

පැවිද්දේ සාර්ථකත්වය නගාගන්නේ කෙසේද?

පැවිදිවීම හෙවත් භික්ෂුත්වයට පත්වීම දුර්ලභවූවා සේ එය යහපත්ව සාර්ථක ව පවත්වා ගෙනයාම ද අතිශයින් ම දුෂ්කර ය. ඒ සඳහා කරුණු රාශියක් ම සම්පූර්ණ විය යුතු ය. භික්ෂු ජීවිතයට ඇතුළත්ව තම ජීවිතය ගුණ පිඩක් කරගැනීමට උත්සාහ දරන්නා විනයානුකූල ව දිවි පැවැත්විය

යුතුය. සිත - කය දෙක ම පැවිදි කරගත් පුද්ගලයාට මෙය එතරම් අසීරු කරුණක් විය නො හැකි ය. පැවිද්දෙන් නියම ඵල නෙළාගැනීමට සිත කය දෙක ම පැවිදි කරගත යුතුය. එසේ වූ විට ශීල - සමාධි ප්‍රඥා යන ත්‍රිවිධ ශික්ෂාවෙහි හික්මී මහණ කම-භික්ෂු ජීවිතය සාර්ථක ලෙස පවත්වා ගත හැකි ය. ශාස්තෘශාසනයේ උගන්වන පර්‍ය්‍යාප්ති-ප්‍රතිපත්ති-ප්‍රතිවේධ යන කරුණු තුන පිළිබඳව භික්ෂුව ඇල්මක් දක්වුවොත් එම භික්ෂු ජීවිතය හැම අතින් ම සාර්ථක වූයේ වේ. සසුනට ඇතුළු වන්නේ නිවන් දකීමට නිසා ප්‍රතිවේධය කෙරෙහි සිත් යොමු කිරීම ඉතා උසස් ය. එහෙත් එය ලබාගැනීමට පර්‍ය්‍යාප්ති-ප්‍රතිපත්ති දෙක ද ඉතා ආවශ්‍යක ය. සසුනේ මුල සීලය නිසා භික්ෂු ජීවිතයේ දී සීලය ප්‍රධානවේ. උපසම්පදව සතරසංවරසීලය ගැබ් කොට පවතී. එනිසා ප්‍රතිපත්තිය භික්ෂුජීවිතයට අතිශයින් ම ආවශ්‍යකය. ප්‍රතිපත්තිය රැකීමට නම් පර්‍ය්‍යාප්ති ධර්මය පිළිබඳ සෑහෙන දැන උගත්කමක් ලැබිය යුතු ය. ධර්මවිනය ඥානය නොමැතිවුවහොත් විනය අවිනය තෝරා ගැනීමට නො හැකි ව මහවිපතකට පත් වේ. භික්ෂුජීවිතයට ඇතුළත්වන්නට පෙර ම සතරබණවර, සේඛියා, චතුරාරක්ඛා දිනචරියා ආදිය පුරුදුපුහුණු කරවන්නේ එබැවිනි තවද ශික්ෂා පද පිළිබඳ ඉගෙනීම නිසා සැකදුරු කරගැනීමටත් ආචීණ්ණකල්පික දැයට ගැති නො වී සෘජු ව විනයානුකූල ව ප්‍රතිපත්ති රැකීමටත් හැකිවේ. භික්ෂුජීවිතය සාර්ථක කර ගැනීමට ආවශ්‍යක තවත් කරුණෙක් නම්: ශ්‍රද්ධාව යි. ''සද්ධා මූලිකා පබ්බජ්ජා'' යනු එහෙයින් වදළහ. ශ්‍රද්ධාව නැතිනම් විනය ශික්ෂාපද රැකීම ඉතා දුෂ්කර කරුණක් සේ වැටහේ. එවිට පැවිදිවීම මහ කරදරයක් බරක් හැටියට සලකා මෝඩකමක් කරගතිමියි තැවෙන්නට සිදු වේ. හොඳ ගුරු ඇසුරද පැවිදි ජීවිතයේ සාර්ථකත්වය පිණිස පවතින්නෙකි. ගිහි ගෙයින් වෙන්ව පැවිදිවීම අමුතුදිවියකට පත්වීමෙකි. ඒ දිවිය යහපත් කරගැනීමට හොඳ ගුරුවරුන්ගේ අවවාද ලැබීම ආවශ්‍යකය. බුදුරජාණන්වහන්සේ විසින් කරුණු රැසෙකින් සම්පූර්ණ වූ ආචාර්ය උපාධ්‍යායයන් වහන්සේලා විසින්ම ශිෂ්‍ය පිරිස පැවිදි උපසපන් කළයුතු යයි අනු දැන වදලේද මේ නිසා මැයි. වාසස්ථානය හා ඇසුරු කරන පිරිස ද හොඳ වූ තරමට පැවිද්ද කරගෙනයාම පහසු ය. අගෝචර-ස්ථානයන් හා ඇසුරට අයෝග්‍ය පුද්ගල-යන් ලැබුණොත් මහණදම වැනැසීමට එය හේතු වියහැකි ය. ගුණ-නුවණ දියුණුකර ගැනීමට මහත් බාධාවක් ද ඉන් විය හැකි ය.

භික්ෂු ජීවිතයේ පරමාර්ථය ද අන්‍ය බොහෝ ජීවිතවල පරමාර්ථයට වඩා වෙනස් මගක් ගෙන ඇත. භික්ෂු ජීවිතයේ මූලික පරමාර්ථය නිර්වාණාවබෝධය සඳහා උත්සාහ කිරීමයි. සසුන්ගුණ පරපුර නො කෙලෙසා නො සිඳ රැකගැනීම යි භික්ෂුව විසින් කළ යුත්තේ තම ජීවිතය යහමගට යොමු කරගෙන ලෝකයේ බොහෝ දෙනාගේ ද හිතසුව පිණිස අර්ථය පිණිස ලොවට අනුකම්පාව පිණිස හැසිරීම යි. භික්ෂු ජීවිතය අනුන්ට ගැති නො වූ ධර්මකාමී යුක්තිගරුක ජීවිතයක් නිසා එයින් දුප්පත් පොහොසත්-උගත්-නූගත් කාටත් අපක්ෂ පාත ව සාධාරණව සේවය කළ හැකියැ. ''අහසෙහි පියාපත් බර පමණක් රැගෙන හැසිරෙන කුරුල්ලකු මෙන් භික්ෂුව සැහැල්ලු ය. නිදහස් ය. තමන්සතු සියලු දේ අතහැර-සිය කෙස් ගසට පවා අහිමි ව නිවන් සෙවීමට අභිනිෂ්ක්‍රමණය කළ ඔහුට තවත් ඒ ජීවිතයේ දී අහිමි වන්නට ඇත්තේ සියපණ පමණි. එබඳු භික්ෂුවට ලෝකයට කළ හැකි සේවය ඉතා විශාල ය. ලෝක වාසී ජනතාවට ලෞකික ලෝකෝත්තර සම්පත් ලබා ගැනීමට හේතුවන හොඳ ක්‍රියාමාර්ග පහද දෙමින් දැහැමින් අනුශාසනා කිරීම භික්ෂු ජීවිතයෙකින් ඉටුවන - ඉටුවිය යුතු වැදගත් ම සේවා

වෙයි. අද බොහෝ දෙනා සිතන්නේ කියන්නේ භික්ෂුජීවිතය අලස - කම්මැලි ජීවිතයක් ලෙසට ය. කාලය කා දමන අකර්මණ්‍ය වැඩකට නැති එකක් ලෙසට ය. එහෙත් භික්ෂූන් තරම් නිරාමිස චේතනා වෙන් ලෝකාර්ථචර්‍යාවෙහි යෙදෙන පිරිසක් තවත් ඇත්දැයි විමසිය යුතු ය. සන්සුන් ඉඳුරන් ඇති භික්ෂුවගෙන් ලොවට කෙතරම් යහපතක් සිදුවේද? යන්නට නිග්‍රෝධසාමණේර කථා පුවතම ප්‍රමාණවත් ය. එද අශෝක රජතුමා බෞද්ධයකු වී බොහෝ ශාසනික කෘත්‍යයන් කරන්නට පටන් ගත්තේ ශාන්ත ඉන්ද්‍රියන් ඇති ඒ නිග්‍රෝධ සාමණේරයන් දැකීම නිසා ය.

පැවිදි සුවය උසස්:

බුදුරජාණන්වහන්සේ ගිහි සැපය පැවිදි සැපය කියා සැප දෙකක් ඇතිබව දේශනාකර තිබේ. එයින් පැවිදි සැපය ඉතාම අග්‍රබව උන්වහන්සේ වදරා ඇත.

'' ද්වෙමානි භික්ඛවෙ සුඛානි කතමානි ද්වෙ? ගිහිසුඛඤ්ච පබ්බජ්ජාසුඛඤ්ච ඉමානි ඛො භික්ඛවෙ ද්වෙ සුඛානි එතදග්ගං භික්ඛවෙ ඉමෙසං ද්වින්නං සුඛානං යදිදං පබ්බජ්ජා සුඛං''[2] යන්නෙන් එය මනාව පැහැදිලි වේ. භික්ෂුජීවිතය හා ගිහි ජීවිතය අතර පරතරය ඉතා විශාල ය. ගිහි ජීවිතය කෙලෙස් ඇතිකරන මග ය. භික්ෂු ජීවිතය කෙලෙස් නිවන මග ය. ගිහි ජීවිතය නොයෙක් උවදුරු වලින් හා පළිබෝධ වලින් පිරුණු නිසා එය කෙලෙස් වැඩීමටත් ගුණ දහම් පිරිහීමටත් හෙතුවේ. සිදුහත් බෝසත්තුමා ගිහිගෙයි ලැබියහැකි ඉතා ම උසස් සැප විඳි කෙනෙකි. සෘතු තුනට සුදුසු තුන්පහයෙක වෙසෙමින් තරුණ දිවිය ගතකළ එතුමා අතට පත් සක්විති රජකම අතහැර පැවිදි වූයේ ගිහි සැපෙහි ඇති නිසරුකම තත්වාකාරයෙන් ම දැන්ගෙන ය. ඒ නිසාමය බුද්ධත්වයට පත්ව එම ගිහිසැපෙහි ආදීනවයත් පැවිදි සැපෙහි ආනිසංසයත්

''සම්බාධොයං ඝරාවාසො-
රජස්සායතනං ඉති
අබ්භොකාසොව පබ්බජ්ජා
ඉති දිස්වාන පබ්බජි''[3]

යයි මෙසේ උත්කර්ෂවත් ලෙස වදළේ.

පැවිදි දිවියේ දී අඹු - දරු කෙත්වතු මිල මුදල් ආදි කාමවස්තු නිසා ඇතිවන දුක් කරදර නො ලැබේ. ඒවා බැහැර කර ඇති නිසා ය. කාමවස්තුන්ගෙන් වෙන්වීම නිසා සිතට ලොකු විවේකයක් දැනේ. ඒ විවේකය නිසා මෛත්‍රී-කරුණා ආදි ගුණ ධර්ම දියුණු කරගත හැකිය. එවිට ඇති වන සැනසීම පැවිදි සැපයෙකි. මහා කප්පින රජතුමා පැවිදි වීමෙන් පසු ගිය ගිය තැන 'අහොසුඛං, අහොසුඛං'' යයි උදන් අනමින් කල්ගත කෙළේ රජකම් කරද්දී තුබූ සැපයට වඩා ලොකු සුවයක් පැවිදිවීමෙන් පසු ලද නිසා ය. පැවිදි දිවියේ ඇති සුවය කොතරම් ද? යන්න එද බුද්ධකාලයේ, පැවිදි දිවියට පත් බොහෝ දෙනා ප්‍රකාශ කළ වචනවලින් මනාව පැහැදිලිවේ. ථෙරගාථාවේ එන

''සුමුත්තිකො සුමුත්තිකො සාහු
සුමුත්තිකොම්හි තීහි ඛුජ්ජකෙහි
අසිතාසු මයා නඞ්ගලාසු මයා
කුද්දලාසු මයා
යදිපි ඉධ මෙව ඉධමෙව
අථවාපි අලමෙව අලමෙව
ඣාය සුමඞ්ගල ඣාය සුමඞ්ගල
අප්පමත්තො විහර සුමඞ්ගල[4]

යන්න එයට කදිම නිදසුනෙකි.

වත්මන් සමාජය දෙස බලන විට වුව ද පැවිදි දිවියේ ඇති අගය මනාව පෙනෙන්ට තිබේ. පැවිදි දිවියේ සිටින සමහරු මෙය මහකරදරකාරී ජීවිතයක් වශයෙන් සැලකුව ද කලින් පැවිදි වී සිට ගිහි භූමියට පත්

බොහෝ දෙනාගේ අදහස අද මේ මිනිස් ලොව ඇති ඉතාම උතුම් සැනසිලිදයක ජීවිතය භික්ෂු ජීවිතය බවයි. පැවිදිවී සිටින විට ගිහි සමාජය දෙව් සැපයක් ලෙස පෙනෙතත් එම දිවියට බැස බලන විට දෙව් සැප තබා මිනිස් සැපවත් විඳින්නට ඉඩක් නොලැබෙන බව පෙනේ. පැවිදි දිවියේ දී ලැබෙන සුවය මෙලොවට පමණක් සීමා නොවේ. පංචකාම වස්තූන්ගෙන් ඈත්වීම නිසා කායවිවේකය ලබා පිළිවෙළින් භාවනා වඩමින් සිය සිත පංචනීවරණයන්ගෙන් මුදවා ක්ලෙශොපධීන්ගෙන් විමුක්තිය ලබා අවසනැ උපධිවිවේකය නම් වූ නිවන් සැපය ළඟා කර ගැනීමට ද මේ භික්ෂුජීවිතයට හැකියාවක් තිබේ.

''ගුණිනි ගුණඥෙ රමතෙ
නාගුණශීලස්ස ගුණානි පරිතොෂඃ''

ගුණ දන්නා අයම
ගුණවතුන් කෙරෙහි
ඇලෙත්.
ගුණහීනයා
ගුණයෙහි
තුටු නො වේ.

---

1. දීඝනිකාය. පරිනිබ්බාන සුත්ත.
2. අංගුත්තර නිකාය-තික නිපාත බුද්ධජයන්ති මු: 154 පිට.
3. සුත්ත නිපාත 406 පිටුව.
4. ථෙරගාථා පාළි 1-5-3.